**මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 - 2024**

**-----------------------------------------------------------------------------**

**1. විගණන මතය**

**1.1** මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 ක මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්ත්වාගණනය කල මතය ප්‍රකාශ කිරීමට හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම.**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවි බැංකුව, ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් වුවද මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ලබාගෙන ඉදිරියේදී කටයුතු කරන බව. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති අංක 01 අනුව ණය ගැතියන් හා ණය හිමියන් හිලව් නොකළ යුතු වුවද, දඹගල්ල ගොවිජන සේවා කාරක සභාවේ ලැබිය යුතු පොහොර ලේකම් කාර්යාල ගිණුම තුල පැවතුන රු.37,770 ක හර ශේෂය, ගෙවිය යුතු ලංකා පොහොර සමාගම් ගිණුමේ බැර ශේෂයට හිලව් කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව කටයුතු කළ යුතුය. |

## 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමණාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 03 ක් සතු වටිනාකම රු.3,569,407 ක් වූ භෞතිකව නොපවතින වත්කම් 12 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව | විධිමත් පරීක්ෂාවක් කර වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීම හෝ ගිණුම්වල ගැලපීම් කළ යුතුය. |
| (ආ) | කාරක සභා 03 ක වටිනාකම රු.5,423,576 ක් වූ ජංගම වත්කම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | ජංගම වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | කාරක සභා 06 ක් විසින් උපලබ්ධි වටිනාකමක් නොමැති රු. 3,940,202 ක් වූ තොග ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | ගිණුම් ප්‍රමිති ප්‍රකාරව වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | කාරක සභා 16 ක් සතු ඉඩම් 19 ක්ද, කාරක සභාවක් සතු ගොඩනැගිලි 09 ක්, කාරක සභා 02 ක් සහ සතු යන්ත්‍ර උපකරණ 05 ක් සහ කාරක සභා 11 ක් සතු කාර්යාල උපකරණ 281 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | කාරක සභා 03 ක වටිනාකම රු.2,973,046 ක් වූ ගිණුම් ශේෂයන් 04 ක් ව්‍යාජ වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | ගෙවිය යුතු බවට තහවුරු කර ගත නොහැකි ශේෂයන් සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් යටතේ සුදුසු පරිදි කටයුතු කිරීමත් ගෙවිය යුතු ශේෂයන් හඳුනාගෙන කඩිනමින් නිරවුල් කිරීමත් කළ යුතුය. |
| (ඊ) | මොනරාගල ගොවිජන සේවා කාරක සභාවේ 2023 වර්ෂයේදී ගිණුම් ශේෂ දෙකක සිදු වී තිබූ රු.87,880 ක් එකතු කිරීමේ දෝෂ සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | අදාළ ගිණුම් විෂයයන්හි ගැලපීම් කර නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | කාරක සභා 03 ක වටිනාකම රු.1,524,015 ක් වූ ආදායම් අඩුවෙන්ද කාරක සභා 03 ක වටිනාකම රු.138,440 ක් වූ ආදායම් නොවන දෑ ආදායම් ලෙසද, ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර, ගිණුම්වල ගැලපීම් කළ යුතුය. |
| (ඌ) | මොනරාගල ගොවිජන සේවා කාරක සභාවේ රු.120,551 ක් වූ ගෙවිය යුතු වරිපනම් බදු අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | ජංගම වගකීම් වල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | කාරක සභා 07 ක වටිනාකම රු.13,010,130 ක් වූ ජංගම නොවන වත්කම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | ජංගම නොවන වත්කම්වල වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | කාරක සභා 05 ක වටිනාකම රු.233,188 ක් වූ ප්‍රාග්ධන වියදම් අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදි වර්ගීකරණයන් සහිතව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු අතර, අදාළ ගැලපීම් කළ යුතුය. |
| (ඔ) | හිඟුරුකඩුව ගොවිජන සේවා කාරක සභාවේ රු.104,976 ක් වූ වියදම් ගිණුම් ශේෂ 02 ක වටිනාකම අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | 2000 වර්ෂයේ දී බිත්තර වී නිෂ්පාදනය සඳහා බුත්තල ජනතා ගොවි සමාගමට බුත්තල ගොවිජන බැංකුව විසින් රු.1,500,000 ක් ලබා දී තිබුණි. ගොවි සමාගම විසින් ණය මුදල් ගෙවීම පැහැර හැරීම මත 2010 නොවැම්බර් 11 දින දක්වා ණය පොළී ලෙස සමාලෝචිත වර්ෂය අවසාන වන විට අය විය යුතු පොළිය රු.2,382,758 ක් ගිණුම් ගත කර තිබුණි. එහෙත් ණය පොළී ආදායම රු.2,395,189 ක් ලෙස ගොවිජන බැංකු මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් රු 12,431ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු අතර, විධිමත් වැඩපිළිවෙලක් යටතේ හිඟ ශේෂය අයකර ගත යුතුය. |
| (ඖ) | අධිකරණ නියෝග මත ණය අයවීම් රු.61,214 ක් අදාල ණය ගැති ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | ණය ගැතියන් හඳුනාගෙන ගිණුම්වලට ගැලපීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | මැදගම ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවීන්ට බෙදා දීමට ලැබී තිබුණු සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති පොහොර කිලෝග්‍රෑම් 91,987 ක වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදිව ගිණුම්ගත කරන බව. | ඉතිරි තොග වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු ය. |

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 08 කට අදාලව ගිණුම් විෂයයන් 16 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම, අනුරූපී වාර්තා අනුව සැසඳීමේදී රු.7,140,270 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදි කරන බව | සැසඳීම් කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

**1.3.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මොනරාගල ගොවිජන සේවා කාරක සභාවට අදාලව රු.90,733 ක් වූ වත්කම් ශේෂ 04 ක් සහ මොනරාගල හා බිබිල ගොවිජන සේවා කාරක සභාවලට අදාළව රු.2,005,958 ක් වූ වගකීම් ශේෂ 18 කට අදාල ණය ගැති ලේඛන ශේෂ සනාථ ලිපි, ණය හිමි ලේඛන, ඇප තැන්පත් ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කිරීමට නොහැකි විය. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සියළු ශේෂයන් සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |

**1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත | | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | 51(7) උප වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 18 හිම ගොවිජන සංවර්ධන සභාවේ සභාපති පත් කිරීම, සභාපතිගේ කාර්යභාරය, ස්ථාවර කාරක සභා පත් කිරීම සහ ලේකම් හා භාණ්ඩාගාරික තෝරාපත් කර ගැනීම පිළිබඳ නියෝග සකස් කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ii) | 54(1) උප වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 18 හිම සෑම කෘෂිකාර්මික ඉඩමකම ඉඩම් හිමි ගොවියා හෝ භුක්තිකරු විසින්, ඒ ඉඩම පිහිටි බල ප්‍රදේශය ඇතුළත වූ ගොවිජන සංවර්ධන සභාව වෙත, එම කෘෂිකාර්මික ඉඩම පිළිබඳව නියමිත විස්තර, එහි අයිතිය, තත් කාලයේ පදිංචිය සහ එම සභාව විසින් සඳහන් කරනු ලැබිය හැකි යම් කාලපරිච්ඡේදයක් ඇතුළත කරගෙන ගිය සියලු කෘෂිකාර්මික කටයුතු පිළිබඳව තොරතුරු ලියවිල්ලකින් දැනුම්දීම කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | - එම - |
| (iii) | 55(1) උප වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 18 හිම කොමසාරිස් ජනරාල්ගේ විධිවිධානවලට අනුකූලව සෑම ගොවිජන සංවර්ධන සභාවක් විසින්ම, ස්වකීය බල ප්‍රදේශය ඇතුලත කෘෂිකාර්මික ඉඩම් මැනීමට සැලැස්විය යුතු වුවද, එසේ කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | - එම - |
| (iv) | 53(4) උප වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 18 හිම කෘෂිකාර්මික කුඹුරු ඉඩම් නාම ලේඛනය සෑම අවුරුදු 03 කට වරක් කොමසාරිස් ජනරාල් විසින් පරීක්ෂා කර සහතික කළ | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | - එම - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | යුතු වුවත්, එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | | |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ මුදල් රෙගුලාසි 133 සහ 134 | | කාරක සභා 16 ක හා ගොවි බැංකු 13 ක සමාලෝචිත වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි කටයුතු කරන බව | පනතේ විධිවිධාන සහ මුදල් රෙගුලාසිවට අනුකූලව කටයුතු කළ යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| (i) | මුදල් රෙගුලාසි 188(2) | 120,682 | අලුත්වැව ගොවිජන සේවා කාරක සභාව විසින් තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසිවල අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 396 (ඇ) | 90,158 | කාරක සභා 03 ක් විසින් නිකුත් කර මාස 06 ඉක්මවූ ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකල චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ | | | | |
| (i) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන | | දඹගල්ල ගොවිජන බැංකුවෙන් ණය ලබා ගත් ගොවීන් සඳහා ගොවි ආපදා | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | චක්‍රලේඛයේ 3.4.11 ඡේදය | | ණය ආවරණ ගිණුමක් පවත්වාගෙන නොතිබුණි. | | යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ii) | 2014 අගෝස්තු 22 දිනැති අංක 07/2014 (අංක 107 සංශෝධන) දරන චක්‍රලේඛය | | දෛනිකව අත රඳවා ගත හැකි උපරිම මුදල රු.10,000 ක් වුවද කාරක සභා 06 ක් විසින් එම සීමාව ඉක්මවා අවස්ථා 99 කදී මුදල් අතරඳවාගෙන තිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව | - එම - |
| (iii) | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛයේ 21.2 ඡේදය | | ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ලේකම්වරයා විසින් අවම වශයෙන් දෙසතියකට වරක්වත් තොග පොත පරීක්ෂා කර එහි ඇතුළත් කර ඇති කරුණු නිවැරදි බවට සෑහීමකට පත් වී තොග පොත අත්සන් කළ යුතු වුවත් තණමල්විල, ඔක්කම්පිටිය, බිබිල හා බඩල්කුඹුර යන ගොවිජන සේවා මධ්‍යස්ථාන 04 හි එසේ සිදු කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | - එම - |
| (ඉ) | 2023 ජනවාරි 26 දිනැති 7/5/9/-05 (මෙහෙ.පො.) 1 වෙළුම දරන චක්‍රලේඛය හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | 30,768,602 | සියඹලාණ්ඩුව සහ කතරගම ගොවිජන සේවා කාරක සභා 02 විසින් 2024 වර්ෂයේදී කෘෂි උපකරණ, කෘෂි රසායන ද්‍රව්‍ය පැළ සහ පොහොර මිලදී ගැනීමේදී එම විධි විධාන අනුගමනය කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පර්ශව වෙත පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 14 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.15,983,518 ක අතිරික්තයක් හා ගොවිජන සේවා කාරක සභා 04 ක් සඳහා රු.1,171,855 ක ඌනතාවයක් වූ අතර ඒ අනුව සමස්ථ අතිරික්තය රු.14,811,663 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සමස්ත අතිරික්තය රු.17,088,510 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,276,847 ක පිරිහීමක් නිරීක්ෂණය

විය. ආදායම් මාර්ග වර්ධනය කර නොගැනීම සහ මෙහෙයුම් ක්‍රියාකාරම්වල වියදම් වැඩි වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | තණමල්විල ගොවිජන සේවා කාරක සභාවේ රු.121,950 ක් වටිනා පොහොර තොග සහ ගොවිජන සේවා කාරක සභා 03 ක වටිනාකම විගණනයට ඉදිරිපත් නොකෙරුණු යන්ත්‍ර 04 ක්ද, කාර්යාල උපකරණ 54 ක්ද සම්බන්ධයෙන් අපහරණය සඳහා නිර්දේශ ලැබී තිබුණද, අපහරණය කර නොතිබුණි. | ඉදිරියේදී අපහරණය කිරීමට කටයුතු කරන බව | විධිමත් පරිදි කටයුතු කර අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කාරක සභා 17 ක් විසින් එම කාරක සභාවලට අයත් ඉඩම් 24 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ඉල්ලීම් කර ඇති බව. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගෙන ගොවිජන සේවා කාරක සභා සතු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය කාරක සභාව නමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 05 ක සමාලෝචිත වර්ෂය අවසන් වන විට ලැබී තිබුණු ඉඩම් නාම ලේඛන සංශෝධන අයදුම්පත්‍ර 381 ක් සංශෝධනය කර නොතිබුණි. | සංශෝධනය කරමින් පවතින බව | ඉඩම් නාම ලේඛන සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු අතර, කාලීනව කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 06 ක සංවර්ධනය කළ යුතු බවට හඳුනාගෙන තිබුණු වාරිමාර්ග ව්‍යාපෘති 93 ක් ප්‍රතිසංස්කරණය නොකිරීමෙන් ලබාගත හැකිව තිබුණු වී අස්වැන්න මෙට්‍රික් ටොන් 1464.67 ක් පමණ අහිමි වී ගොස් තිබුණි. | ප්‍රතිපාදන නොලැබීම මත ප්‍රතිසංස්කරණය කිරීමට නොහැකි වූ බව හා ප්‍රතිපාදන ලද පසු ප්‍රතිසංස්කරණය කරන බව | ප්‍රතිපාදන ලබාගෙන ප්‍රසංස්කරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා බල ප්‍රදේශයේ ගොවීන්ගේ කෘෂිකාර්මික අවශ්‍යතා සපුරාලීමට ප්‍රාදේශීය මට්ටමින් ගොවිජන සේවා කාරක සභා පිහිටුවා ඇතත් ගොවිජන සේවා කාරක සභා 12 ක් විසින් මාස 03 ක | කාරක සභිකයින් සම්බන්ධ කර ගැනීමට නොහැකි වූ බැවින් නොපැවැත් වූ බව | ගොවිජන සේවා කාරක සභා රැස්වීම් මාසිකව සක්‍රීය අන්දමින් පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සිට මාස 10 ක් දක්වා කාරක සභා රැස්වීම් පවත්වා නොතිබුණි. | | |
| (ඊ) | Geo Goviya වැඩ සටහන යටතේ කුඹුරු ඉඩම් මැන අවසන් කළ යුතු වුවද කාරක සභා 08 ක ඉඩම් කැබලි 8738 ක් මැනුම් කටයුතු සිදු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් ලබාගෙන ඉදිරියේදී කටයුතු කර බව | කඩිනම් වැඩපිළිවෙලක් යොදා කුඹුරු ඉඩම් මැන අවසන් කළ යුතුය. |
| (උ) | කාරක සභා 06 ක කෘෂිකාර්මික ගොඩ ඉඩම් හෙක්ටයාර 236.44 ක් වගා කරවීමට කෘෂිකාර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | කාර්යක්ෂමව ඉඩම් වගා කරවීමට කටයුතු කරමින් පවතින බව | කාර්යක්ෂමව වගා කරවීමට කටයුතු කළ යුතු අතර, විධිමත් අධීක්ෂණයක් සිදු නොකළ නිලධාරින්ට පියවර ගත යුතුය. |
| (ඌ) | කාරක සභා 04 ක පොහොර කිලෝග්‍රෑම් 10,772.75 නිශ්කාර්යව පැවතුණි. | ඉදිරි කන්නවලදී ගොවීන්ට නිකුත් කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව | විධිමත් පරීක්ෂාවක් සිදු කර ප්‍රයෝජනයට ගැනීමට හෝ නිසි අනුමැතිය මත අපහරණය කිරීමට හෝ අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (එ) | කාරක සභා 10 ක ප්‍රතිසංස්කරණය කළ යුතු බවට හඳුනාගෙන තිබුණු වාරිමාර්ග ව්‍යාපෘති 206 ක් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | විධිමත් වැඩපිළිවෙලක් යටතේ ප්‍රතිපාදන ලබාගෙන ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඒ) | බුත්තල ගොවිජන සේවා කාරක සභාවේ වටිනාකම රු.5,425 ක් වූ පැල 31 ක්, රු.32,385 ක් වූ සහනාධාර පොහොර කිලෝග්‍රෑම් 1182 ක්ද වටිනාකම සඳහන් නොවූ වැඩිමිල පොහොර කිලෝග්‍රෑම් 808 ක්ද කල් ඉකුත් වී තිබුණු අතර, ඒවා අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | විධිමත් අනුමැතිය මත අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු ය. |
| (ඔ) | ගොවිජන සේවා කාරක සභා 05 ක කුඹුරු ඉඩම් හෙක්ටයාර් 100.08 ක් වගා නොකිරීමෙන් ලබාගත හැකිව තිබුණු වී අස්වැන්න මෙට්‍රික් ටොන් 119.99 ක් පමණ අහිමි වී තිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් විසින් වගා කරවීමට විධිමත් පරිදි කටයුතු කළ යුතු ය. |
| ( ඕ ) | තණමල්විල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ 2022/2023 මහ කන්නයේ සිට 2023/24 මහ කන්නය දක්වා ගොවීන්ගේ හා ගොවි සංවිධානවල අවශ්‍යතාවයකින් තොරව මිලදීගෙන තිබූ | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | අවශ්‍ය පොහොර ප්‍රමාණයන් නිවැරදිව හඳුනාගෙන මිලදී ගත යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

රු.5,925,263 ක් වටිනා පොහොර කිලෝග්‍රෑම් 38,805 ක් හා ඔක්කම්පිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඇනවුම් කිරීමකින් තොරව විකුණා මුදල් ගෙවීමේ පදනම මත ලබාගෙන තිබුණු රු.680,000 ක් වටිනා පොහොර තොගයක් අලෙවි නොවීම මත ගබඩාවේ තැන්පත් කර තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**3.2.1 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 13 ක් සතු වටිනාකම රු.9,136,532 ක් වූ වත්කම් 29 ක් හා වටිනාකම දක්වා නොමැති වත්කම් 32 ක් මාස 02 ත් අවුරුදු 18 ක් අතර කාලපරිච්ඡේදයක සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනීමට හෝ එසේ ප්‍රයෝජනයට ගත නොහැකි නම් අනුමැතීන් ලබාගෙන අපහරණ කිරීමට කටයුතු කරන බව. | වත්කම් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.3 මානව සම්පත් කලමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලය සහ ගොවිජන සේවා කාරක සභාවලට අදාලව තනතුරු දෙකක සේවකයින් 04 ක අතිරික්තයක් සහ තනතුරු 16 ක සේවකයින් 189 ක ඌනතාවයක් පැවතිණි. | ප්‍රධාන කාර්යාලයේ උපදෙස් අනුව කටයුතු කරන බව. | කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අවශ්‍යම කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවිය යුතුය. |

**4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 11 ක් විසින් දින 04 සිට මාස 03 දින 11 දක්වා ගිණුම් ඉදිරිපත් කිරීමට ප්‍රමාද වී තිබුණු අතර වැල්ලවාය ගොවිජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර ඒ සඳහා ගොවිජන සංවර්ධන නිලධාරීන් මෙහෙය වන බව | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

**4.2 ගොවිජන බැංකු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1999 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුල කාරක සභා 18 ක් විසින් ගොවීන් 1301 කට නිකුත් කරන ලද කෘෂි ණය මුදලින් රු.46,131,337 ක් , කාරක සභා 07 ක් විසින් ගොවීන් 55 කට නිකුත් කරන ලද ව්‍යාපෘති ණය මුදලින් රු.2,948,548 ක් , කාරක සභා 01 ක් විසින් ගොවීන් 02 කට නිකුත් කරන ලද ව්‍යවසායක ණය මුදලින් රු.100,000 ක්, කාරක සභා 07 ක් විසින් ගොවීන් 198 කට නිකුත් කරන ලද විශේෂ බඩ ඉරිඟු ණය මුදලින් රු.14,282,613 ක් හා කාරක සභා 05 ක් විසින් ගොවීන් 197 කට නිකුත් කරන ලද කෘෂි උපකරණ සහ වෙනත් ණය මුදලින් රු.14,390,401 ක් ලෙස එකතුව රු.77,852,899 ක් අයකර ගෙන නොතිබුණි. | අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම, ගොවිජන විනිශ්වය සභාව වෙත යොමු කිරීම, කාර්යාල පරීක්ෂණ පැවැත්වීම සහ දැනුවත් කිරීම් ලිපි යොමු කිරීම මගින් අයකර ගැනීමට කටයුතු කරන බව. | ණය ලබා දීම් හා කාලීනව අයකර නොතිබීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදු කර අදාළ පාර්ශව වෙත පියවර ගැනීමටත්, අදාළ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ණය මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 04/2012 හා 2012 පෙබරවාරි 29 දිනැති චක්‍රලේඛයේ 1.6 (iii) යටතේ යැපුම් මට්ටමේ කෘෂිකර්මාන්තය වාණිජමය මට්ටමකට පත්කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සහ උපදේශාත්මක පහසුකම් සලසා දීම, ගොවිජන බැංකුවේ අභිමතාර්ථයක් වුවද, 2024 වර්ෂයේ දී ගොවිජන සේවා කාරක සභා 10 ක කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර වසම් 87 ක් සඳහා ණය පහසුකම් ලබාදී නොතිබුණි. | ගොවීන්ගේ ඉල්ලීම් අනුව පවතිකන අරමුදල් සලකා ණය ලබා දීමට කටයුතු කරන බවත් බොහෝ වසම්වල ගොවීන් ණය ඉල්ලීම් කර නොමැති බව | බැංකු ස්ථාපිත කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් වෙදිය යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා බල ප්‍රදේශ 10 ක ගොවි පවුල් 24,723 ගොවි බැංකුවේ සාමාජිකත්වය ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී ඒ සඳහා කටයුතු කරන බව | ගොවීන් සියළු දෙනා ගොවිජන බැංකු ක්‍රමයට දායක කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 11 ක 1991 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අයවිය යුතු ණය ගැති ශේෂ 47 ක වටිනාකම වූ රු.29,968,217 ක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව | නොපමාව අය කර ගැනීමට කටයුතු කළ යුතු අතර, කාලීනව ණය අය නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03 ක 1999 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා අයවිය යුතු රු.199,677 ක හිඟ අක්කර බදු අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව | ගොවිජන සංවර්ධන පනත සහ චක්‍රලේඛ ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර, කාලීනව අය නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 07 ක 1993 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පැවත එන ණය හිමි ශේෂ 26 ක එකතුව වූ රු.27,335,512 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව | අදාළ පාර්ශවයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |